රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி: **(94) 011- 2696211-13** Telephone **(94) 011- 2166000**
ෆැක්ස් தொலைநகல்: **(94) 011- 2695279** Fax
ඊ-මේල් மின்னஞ்சல்: **information@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය எனது இல My No | PS/GT/2019-1 | ඔබේ අංකය உமது இல Your No | | දිනය திகதி: Date | 2020.12.20 |

2019.08.01 වන දින II අදියර වශයෙන් හා 2019.09.16 දින III අදියර වශයෙන් දැනට පුහුණුව ලබන සියලුම අභ්‍යාසලාභී උපාධිධාරීන් වෙත

**උපාධිධාරී අභ්‍යාසලාභීන්ට ස්ථිර පත්වීම් ලබා දීම - 2019 අදියර II සහ III මාර්ගගත ක්‍රමයට තොරතුරු ලබා ගැනීම**

අමප/20/1323/304/018 අංක හා 2020.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අදාළ උපාධිධාරී අභ්‍යාසලාභීන් වෙත ස්ථිර පත්වීම් ලබා දීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

02. මෙම අභ්‍යාසලාභී උපාධිධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා අත්‍යවශ්‍ය තොරතුරු කැඳවිය යුතුව ඇත. ඒ සඳහා වන මාර්ගගත මෘදුකාංගයට 2020.12.22 වන දින පෙ.ව. 8.00 සිට පහත සබැඳිය (Link) මඟින් ප්‍රවේශ වී (login) ඔබගේ තොරතුරු ඇතුළත් කළ යුතු වේ. ඒ සඳහා 2020.12.31 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා කාලය ලබා දෙනු ලැබේ.

http://43.224.125.68:7000

03. රජයේ ආයතනවල සහ පළාත් සභාවල පුහුණුව ලබන උපාධිධාරී අභ්‍යාසලාභීන් 12000කට අධික පිරිසකගේ තොරතුරු සමඟ කටයුතු කිරීමට සිදුවන බැවින් ද ඔවුන්ගේ ඉදිරි මානව සම්පත් කළමනාකරණ කටයුතු සඳහා ද මෙම මෘදුකාංගය උපයෝගී කර ගැනීමට නියමිත බැවින් ද සෑම උපාධිධාරී අභ්‍යාසලාභියෙකුටම සිය තොරතුරු ඇතුළත් කිරීම සිදු කළ යුතු වේ. එසේ තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු නොකරන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ පත්වීමක් අපේක්ෂා නොකරන අයෙකු ලෙස සැලකීමට සිදු වේ.

**පරිශීලක නාමය (Username), මුරපදය (Password)**

- ඔබ මෙම පුහුණුව සඳහා අයදුම් කරන ලද අවස්ථාවේ දී ඔබ විසින් ලබා දුන් ජාතික හැඳුනුම්පත් අංකය පරිශීලක නාමය වේ.

  උදා: 791234567V හෝ 197912340567 වශයෙන්

- මුලින් REC_ ලෙස සඳහන් කර ඔබ වෙත දැනටමත් **ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති පත්වීම් ලිපියේ සඳහන්** පත්වීම් අංකයේ අවසන් ඉලක්කම් 03 ප්‍රථමයෙන්ද, ඔබ විසින් ඉහත පරිශීලක නාමය ලෙස සඳහන් කළ ජාතික හැඳුනුම්පත් අංකයේ අවසාන අංක 03 දෙවනුව ද ගත් විට ඔබගේ මුරපදය සෑදේ.

  | | | |
  |---|---|---|
  | උදා:- | පත්වීම් අංකය: | ........................../027 |
  | | ජා.හැ.අං: | 791234567v |
  | | මුරපදය: | REC_027567 |

- අයදුම්පත පිරවීමේ දී සිංහල/දෙමළ අකුරු යතුරු ලියනය කිරීමේ දී Unicode Font භාවිතා කරන්න.

**අයදුම්පත සම්පූර්ණ කළ පසු අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල**

(i) සම්පූර්ණ කරන ලද අයදුම්පත Submit කරන්න.

(ii) එම අයදුම්පත මුද්‍රණය කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇති අතර A-4 කඩදාසිය දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කරන්න.

(iii) මුද්‍රිත පිටපතේ අදාළ ස්ථානයේ ඔබගේ අත්සන තබන්න.

04. මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියාගේ සහතිකය ද සමඟ අවශ්‍ය අනෙකුත් ලේඛන ද සමඟ මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඉදිරියේ දී දැනුවත් කරනු ලැබේ. එතෙක් පහත ලේඛන සූදානම් කර ගන්න.

1. ජාතික හැඳුනුම්පතේ පිටපතක්
2. උප්පැන්න සහතිකයේ පිටපතක්
3. උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයේ පිටපතක්
4. DS 04 ආකෘතිය මඟින් නිකුත් කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකය

ඉහත ලේඛන අතුරින් ඡායාපිටපත් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන (ග්‍රාම නිලධාරි සහතිය DS 04 ආකෘතිය හැර) අයදුම්කරු විසින්ම සත්‍ය පිටපතක් බවට සහතික කළ යුතුයි.

සැ.යු. - මෙම ලේඛන විධිමත් ආකාරයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතු ආකාරය පසුව නිවේදනය කරන අතර එසේ දන්වන තෙක් මෙම ලේඛන අමාත්‍යාංශය වෙත යොමු නොකරන ලෙස තරයේ අවධාරණය කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :- සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ආයතන ප්‍රධානීන්

} මේ සමඟ අමුණා ඇති (Annex: GT/2019/02) ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර පුහුණු කාල සීමාව සම්බන්ධව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව හා උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරියා පුහුණු කාල සීමාව තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එම නිවාඩු සඳහා අනුමැතිය ලබා ගත් ලිපියේ සහතික කළ පිටපතක් ද පුහුණුවට වාර්තා කළ දිනය (රාජකාරී භාර ගැනීමේ ලිපිය) සනාථ වන ලිපියේ සහතික කළ පිටපතක් ද සමඟ නිලධාරියා විසින් මාර්ගතගත ක්‍රමයට මුද්‍රණය කර ඔබ වෙත ලබා දෙන අයදුම්පත ද අමුණා ඉදිරියේ දී දැනුම් දෙන පරිදි මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

Annex: GT/2019/02

# උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීම - 2019 *II* සහ *III* අදියර

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

(උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරියා පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් අවසාන වශයෙන් සහතික කළ යුතු ය. )

උදා:

i. ස්වදේශ කටයුතු විශයභාර අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අනුයුක්තව පුහුණුව ලැබූ අභ්‍යාසලාභී උපාධිධාරියෙකු නම් මෙම ආකෘතියේ ආයතන ප්‍රධානියා ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් ද දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස අදාළ දිස්ත්‍රික් ලේකම් ද සහතික කළ යුතු ය.

ii. කිසියම් අමාත්‍යාංශයක්/දෙපාර්තමේන්තුවක් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අනුයුක්තව පුහුණුව ලැබූ අභ්‍යාසලාභී උපාධිධාරියෙකු නම් මෙම ආකෘතියේ ආයතන ප්‍රධානියා ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් ද දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස අදාළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ද සහතික කළ යුතු ය.

**1.** නිලධාරියාගේ නම (මුලකුරු සමඟ): ……………………………………………………………………………………

**2.** උපාධිධාරී අභ්‍යාසලාභී පත්වීම් දිනය: ………………………………………………………………………………

**3.** පුහුණුවට වාර්තාකළ දිනය (රාජකාරි භාරගත් දිනය): ………………………………………………………………

**4.** නිවාඩු විස්තර :

***a.***

| වර්ෂය සහ මාසය | සාමාන්‍ය නිවාඩු | ප්‍රසූත නිවාඩු නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|---|
| **2019** | | | |
| අගෝස්තු | | | |
| සැප්තැම්බර් | | | |
| ඔක්තෝම්බර් | | | |
| නොවැම්බර් | | | |
| දෙසැම්බර් | | | |
| **2020** | | | |
| ජනවාරි | | | |
| පෙබරවාරි | | | |
| මාර්තු | | | |
| අප්‍රේල් | | | |
| මැයි | | | |
| ජූනි | | | |
| ජූලි | | | |
| අගෝස්තු | | | |
| සැප්තැම්බර් | | | |
| ඔක්තෝම්බර් | | | |
| නොවැම්බර් | | | |
| දෙසැම්බර් | | | |

***b.*** වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එය සැලකිල්ලට ගත්විට වසරක පුහුණුව සම්පූර්ණ කරන දිනය

……………………………………………………………

<u>**ආයතන ප්‍රධානියාගේ සහතිකය**</u>

මෙම ආයතනයට අනුයුක්තව පුහුණුව ලැබූ ………………………………………………………………………… (ගරු ස්වාමීන්වහන්සේ/මහතා/මහත්මිය/මෙනවිය) ගේ සේවා තත්ත්වය සතුටුදායක බැවින් ස්ථිර පත්වීමක් සඳහා නිර්දේශ කරමි./……………………………………………………………… හේතුවෙන් ස්ථිර පත්වීමක් සඳහා නිර්දේශ නොකරමි.

………………………………………… ………………………………………………………

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න.)

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**</u>

…………………………………………………………………………………………………………………… (ගරු ස්වාමීන්වහන්සේ/මහතා/මහත්මිය/මෙනවිය) සතුටුදායක ලෙස පුහුණුව අවසන් කර ඇති බැවින් ස්ථිර පත්වීමක් සඳහා නිර්දේශ කරමි./……………………………………………………………………… හේතුවෙන් ස්ථිර පත්වීමක් සඳහා නිර්දේශ නොකරමි.

අදාළ නොවන වගන්තිය කපා හරින්න.

(i) මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරි සේවයේ පුරප්පාඩු පවතින අතර නිලධාරියා මෙම ආයතනයටම අනුයුක්ත කිරීම නිර්දේශ කරමි.

(ii) ……………………………………………………………………………………………… හේතුවෙන් මෙම නිලධාරියා මෙම අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම නිර්දේශ නොකරමි.

………………………………………… ………………………………………………………

දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න.)